# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**8 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය**

නම/ විභාග අංකයඃ ......................................... කාලය පැය 2 යි

**I කොටස**

- **උපදෙස් - 01 - 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) බුද්ධ ශාසනයේ සංඝභේදය ඇති කරමින් පංච වරයක් ඉල්ලා සිටියේ,
   i. ආනන්ද හිමි  ii. උපාලි හිමි
   iii. දේවදත්ත හිමි  iv. නන්ද හිමි

2) බුදුරජාණන් වහන්සේ "රජෝ හරණං, රජෝ හරණං" යනුවෙන් රෙදිකඩ පිරිමැදීමට අනුශාසනා කළේ,
   i. රාහුල හිමිට  ii. චුල්ල පන්ථක හිමිට
   iii. කුමාර කාශ්‍යප හිමි  iv. අනුරුද්ද හිමි

3) "මහනෙල් සුවඳ මය, කුඩමසු පිළි ගඳමය" යන පද්‍ය රචනා කළේ,
   i. වෑත්තෑවේ හිමි  ii. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
   iii. පැළෑනේ සිරි වජිරඥාණ හිමි  iv. බුද්ධ ඝෝෂ හිමි

4) "භවත්නි, නිහඬ වන්න. ශබ්ද කරන්න එපා, ශ්‍රමණ භවත් ගෞතමයෝ එති. ඒ ආයුෂ්මත්හු නිහඬ බව කැමති වෙති එහි ගුණ කියයි " ආදී ලෙස ප්‍රකාශ කළේ,
   i. සකුළුදායි පිරිවැජියා  ii. උපාලි ගෘහපති
   iii. භාරද්වාජ බමුණා  iv. සංජය පිරිවැජියා

5) "සන්දිට්ඨිකෝ" යන්නෙහි තේරුම වන්නේ,
   i. තමාගේ නුවනින් අවබෝධ කර ගත හැකි බව
   ii. පැමිණ, ධර්මය විමසා බලන්න
   iii. ඕනෑම කාලයක අවබෝධ කළ හැකි බව
   iv. ධර්මය ප්‍රගුණ කරන්නන්ට ඒ මොහොතේදීම ප්‍රතිඵල ලැබිය හැකි බව

6) බුදුගුණ භාවනාවේ ආනිසංසයක් නොවන්නේ,
   i. නපුරු සිහින දැකීම  ii. සුවපහසු නින්දක් ලැබිය හැකි වීම
   iii. පාපයට ලැජ්ජාවට බිය ඇතිවීම  iv. සිත සමාධිගත වීම

7) පෙකණිය නොදක්වා - සළු ඇඳ බොලට දක්වා
   නොපව තන දක්වා - සිනා නොමසෙන් දසන් දක්වා යන කවි පෙළ සඳහන් වන ග්‍රන්ථය,
   i. සිරිත් මල්දම  ii. කාව්‍ය ශේඛරය
   iii. බුදුගුණ අලංකාරය  iv. සුභාෂිතය

8) සතර සංග්‍රහ වස්තු වලට අයත් වන්නේ,

i. දානය
ii. ශීලය
iii. පරිත්‍යාගය
iv. තපස

9) මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥා මහිමය ඉස්මතු කරන ජාතක කතාව වන්නේ,

i. සේරිවාණිජ ජාතකය
ii. උම්මග්ග ජාතකය
iii. වෙස්සන්තර ජාතකය
iv. බක ජාතකය

10) සත්ත්වයාගේ ආයුෂත්, කර්ම ශක්තියත් දෙකම ඉතිරිව තිබියදී හදිසි අනතුරු, ලෙඩ රෝග වැනි උපද්‍රවයකින් මරණයට පත් වීම.

i. ආයුක්ඛය
ii. උභයක්ඛය
iii. උපච්ඡේදක
iv. කම්මක්ඛය

11) ලෝක පාලක ධර්ම ලෙස හඳුන්වන්නේ,

i. සැපදුක
ii. පාපයට ලැජ්ජාව හා බිය
iii. නින්දා ප්‍රශංසා
iv. ලාභ අලාභ

12) කාම තණ්හාව යනු,

i. පැවැත්මට ඇති ආශාව
ii. මෙලොව පැවැත්ම පමණක් පිළිගැනීම
iii. පස්කම් සැපතෙහි ඇල්ම
iv. ශරීරයට අධික දුක් ලබා දෙමින් නිවන් ලබා ගැනීම

13) සම්බුදු සසුන රඳා පවතින්නේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය නිසා බව බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,

i. සැරියුත් හිමිට
ii. මුගලන් හිමිට
iii. ආනන්ද හිමිට
iv. මහා කාශ්‍යප හිමිට

14) සැරියුත්, මුගලන් හිමිවරුන් රහත්භාවයට පත් වූ සූත්‍රය වන්නේ,

i. දම්සක් පැවතුම් සූත්‍රය
ii. වේදනා පරිග්ගහ සූත්‍රය
iii. පත්තකම්ම සූත්‍රය
iv. වසල සූත්‍රය

15) බුදුරජාණන් වහන්සේ තමා උපමා කොට අන් අයට හිංසාවට, පීඩාවට ලක් නොකළ යුතු බව දැක් වූ සූත්‍ර ධර්මය වන්නේ,

i. වේලුද්වාර සූත්‍රය
ii. වසල සූත්‍රය
iii. මහා මංගල සූත්‍රය
iv. රතන සූත්‍රය

16) කයින් සිදුවන අකුසල කර්මයක් නොවන්නේ,

i. සතුන් මැරීම
ii. කේලාම් කීම
iii. සොරකම් කිරීම
iv. කාමයේ වරදවා හැසිරීම

17) සතර බ්‍රහ්ම විහරණ ධර්මයන්ට අයත් වන්නේ,

i. දානය
ii. ප්‍රියවචනය
iii. අර්ථ චරියාව
iv. කරුණාව

18) උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නෙහි තේරුම වන්නේ,

i. මල් ගඳ විලවුන් ගැල්වීම නොකළ යුතු බව
ii. අවේලාවේ ආහාර ගැනීමෙන් වැලකීම
iii. උස් ආසන හා මහා ආසන පරිභෝගයෙන් වැළකීම
iv. ගී කීම හා බෙර වැයීමෙන් වැළකීම

19) බුදුරජාණන් වහන්සේ සප්ත අපරිහානිය ධර්මය දේශනා කළේ,

i. බිම්බිසාර රජුට
ii. මල්ල රජදරුවන්ට
iii. ලිච්ඡවී රජදරුවන්ට
iv. කොසොල් රජුට

20) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසු පළමු වරට ලංකාවට වැඩම කළේ,

i. නාගදීපයට
ii. මහියංගනයට
iii. කැලණිය
iv. දීඝවාපිය

(ල. 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20ක්ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.**

1) දෙවන වාරයේ ඔබ විසින් සිදු කළ පාසල් පාදක ඇගයීම් ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ඔබ ඉටු කළ ඇගයීම කුමක්ද? ඒ කවර පාඩම ඇසුරින් ද?
ii. සාකච්ඡාවට ලක් වූ ප්‍රශ්නයක් හා පිළිතුරක් දක්වන්න.
iii. බුදුරදුන්ගේ ආගමික සහජීවනය උදෙසා අනුගමනය කළ කරුණු දෙකක් දක්වන්න.
iv. ඔබ සාකච්ඡා මණ්ඩපයෙන් ලබා ගත් දැනුම අනුව, මිනිසා තුළ පැවතිය යුතු උසස් මානව ගුණාංග දෙකක් ලියන්න.
v. ශ්‍රී ලාංකිකයන්ගේ සහජීවන ගුණයට උදාහරණ දෙකක් ලියන්න.
vi. පැරණි ලාංකිකයන්ගේ සමාජ සම්බන්ධතා පැවති අංශ දෙකක් දක්වන්න.
vii. බෞද්ධයන් මෙන්ම අන්‍ය ආගමිකයින් ද වන්දනාමාන කරනු ලබන ආගමික ස්ථාන දෙකක් ලියන්න.
viii. සාකච්ඡා මණ්ඩපය කරගෙන යාමට ගුරුතුමාගෙන්/ ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.
ix. සාකච්ඡා මණ්ඩපයෙන් ඔබ ලබාගත් අත්දැකීම් දෙකක් සඳහන් කරන්න.
x. ශ්‍රී ලාංකිකයින් විසින් වර්තමානයේ භේදයකින් තොරව සමරනු ලබන ආගමික උත්සව දෙකක් දක්වන්න.

(ල. 20)

2)

i. භික්ෂුණී ශාසනය පිහිටුවීම සඳහා මූලිකව කටයුතු කළ තෙරණිය කවුද? (ල. 02)
ii. දෙව්දත් තෙරුන් ඉදිරිපත් කළ පංචවරයෙන් තුනක් නම් කරන්න. (ල. 03)
iii. බුද්ධ චරිතයෙන් හෙළිවන ආචාරශීලී ගති පැවතුම් පහක් ලියන්න. (ල. 05)

3)

i. ලෝකයේ කිසිවෙකුටත් මිල කල නොහැකි රත්න තුන නම් කරන්න. (ල. 02)

ii. ධර්ම රත්නයේ ගුණ තුනක් ලියන්න. (ල. 03)

iii. ධර්ම රත්නයේ ගුණ ඇතුළත් ගාථාව ලියා දක්වන්න. (ල. 05)

4)

i. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි
චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා" යන පාලි පාඨයේ සිංහල තේරුම ලියා දක්වන්න. (ල. 02)

ii. වචනයෙන් සිදුවන අකුසල කර්ම තුනක් නම් කරන්න. (ල. 03)

iii. සදාචාරවත් සමාජයක තිබිය යුතු හොඳ ගුණාංග පහක් ලියන්න. (ල. 05)

5)

i. පන්සිය පනස් ජාතක පොත ලිව්වේ කුමන යුගයේද? (ල. 02)

ii. උම්මග්ග ජාතකයේ ඇතුළත් පණ්ඩිතවරු තිදෙනෙක් නම් කරන්න. (ල. 03)

iii. මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥා මහිමය කියැවෙන කතා පුවතක් කෙටියෙන් ලියා දක්වන්න. (ල. 05)

6)

i. බුදුදහමට අනුව යහපත් සමාජ සම්බන්ධතා පිළිබඳ ඉගැන්වෙන සූත්‍ර දේශනාව කුමක්ද? (ල. 02)

ii. ස්වාමියා විසින් තම භාර්යාවට ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න. (ල. 03)

iii. හිත මිතුරන් ඇසුරු කිරීමේදී අනුගමනය කළ යුතු පිළිවෙත් පහක් දක්වන්න. (ල. 05)

7)

i. නිග්‍රෝධ නම් කුඩා සාමණේර හිමි නමගේ ආචාරශීලී ගති පැවතුම් දැක තෙරුවන් සරණ ගිය අධිරාජ්‍යයා කවුද? (ල. 02)

ii. පැවිදි පක්ෂය විසින් පිළිපැදිය යුතු සේඛියා ධර්ම තුනක් ලියන්න. (ල. 03)

iii. ශිෂ්‍ය ජීවිතය තුළ ආහාර ගැනීමේදී පිළිපැදිය යුතු ගුණාංග පහක් ලියන්න. (ල. 05)